# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## පිරිසිදු කරන්නන් භාර කණ්ඩායම් නායක [කාන්තා/පුරුෂ]

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක/අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

පිරිසිදු කිරීම් / ජැනිටර් කණ්ඩායම් නායකයා විසින් 2022 මුල් භාගයේ විවෘත කිරීමට නියමිත නව තානාපති කාර්යාල පරිශ්‍රය ඇතුළු තානාපති කාර්යාලයට අයත් ගොඩනැගිලි වල ද, ඇමෙරිකානු මධ්‍යස්ථානයේ ද පිරිසිදු කිරීම් හා භාරකාර කටයුතු සිදුකරන ජැනිටර්වරුන් 12 දෙනෙකුට කාර්යය මඟපෙන්වීම් සිදුකළ යුතු ය. එසේම මෙම තනතුර දරන්නා විසින් සියලුම තානාපති කාර්යාල ගොඩනැගිලි වල සේවාවන් සඳහා වැඩමුර සකස් කර ක්‍රියාත්මක කිරීමත්, සෑම ජැනිටර්වරයෙකුටම නියමිත රාජකාරීන් සහ පිරිසිදු කිරීමේ ක්‍රියාපටිපාටීන් පැවරීමත් සිදුකළ යුතු ය. මීට අමතරව තානාපති කාර්යාලයේ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන අධීක්ෂණය කිරීමත්, ජැනිටර් කණ්ඩායමට අවශ්‍ය සැපයුම් සියල්ල ඇණවුම් කර නිකුත් කිරීමත් කළ යුතු ය.

**පූර්ණ කාලීනව සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප රු. 74,288/- කි.**

**සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:**

1. **අධ්‍යාපනය** - අ.පො.ස. සාමාන්‍ය පෙළ පරීක්ෂණය නිමකර තිබිය යුතු ය (ගණිතය විෂයය ඇතුළුව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු අතර අවම වශයෙන් විෂයයන් 03ක් සඳහා විශිෂ්ඨ සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය.). එසේම ගෘහපාලනය පිළිබඳ මාස 03ක පුහුණු ශිල්පී මට්ටමේ ආධුනිකත්ව පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතු ය. **(අදාළ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**
2. **පූර්ව රැකියා පළපුරුද්ද** - වෘත්තීය මට්ටමේ ජැනිටර්වරයෙකු / පිරිසිදු කරන්නෙකු ලෙස අවම වශයෙන් වසර 03ක රැකියා පළපුරුද්ද තිබිය යුතු ය. **(අදාළ සේවා / ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**
3. **භාෂා ප්‍රවීණතාවය** - II වන මට්ටමේ (සීමිත දැනුම ) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
   **(මෙය පරීක්ෂා කරනු ලැබේ ).**
   III වන මට්ටමේ (මනා කාර්යක්ෂම දැනුම ) සිංහල සහ/හෝ දෙමළ භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

**හෝ**

1. **අධ්‍යාපනය** - අ.පො.ස. සාමාන්‍ය පෙළ පරීක්ෂණය නිමකර තිබිය යුතු ය (ගණිතය විෂයය ඇතුළුව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු අතර අවම වශයෙන් විෂයයන් 03ක් සඳහා විශිෂ්ඨ සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය.) **(අදාළ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**
2. **පූර්ව රැකියා පළපුරුද්ද** - වෘත්තීය මට්ටමේ ජැනිටර්වරයෙකු / පිරිසිදු කරන්නෙකු ලෙස අවම වශයෙන් වසර 04ක රැකියා පළපුරුද්ද තිබිය යුතු ය. **(අදාළ සේවා / ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**
3. **භාෂා ප්‍රවීණතාවය** - II වන මට්ටමේ (සීමිත දැනුම ) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
   **(මෙය පරීක්ෂා කරනු ලැබේ ).**
   III වන මට්ටමේ (මනා කාර්යක්ෂම දැනුම ) සිංහල සහ/හෝ දෙමළ භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

**අවශ්‍ය ලේඛන:**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම් පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

**අයදුම් කරන ආකාරය:**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරී ව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**තැපැල් හෝ ඊමේල් මගින් එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2021 **ඔක්තෝබර් 27** වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.

තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සලකන්න.